# Project 194
# 194 වන ව්‍යාපෘතිය




DP EDUCATION

## Coding School




වෙබ් පිටුව බලන්න

Glitch ආරම්භ කරන්න

LIVEWORKSHEETS

# CSS වලදී element එකක් style කරන ආකාරය.

## Basic Selectors

- css වලදී style කිරීම ට අවශ්‍ය element එක select කරන ආකාර කිහිපයක් පවති.

  - Types
  - ID
  - Class
  - Attribute

- Html tag භාවිතා කරමින් අවශ්‍ය element එක style කරන ආකාරයට types style වේ.

- උදාහරණට html body tag එකට style එකක් ලබා දිම.

style.css    PRETTIER

```css
body{
    margin: 10px;
}
```

- අපට element එකක් select කර ගන්න පුලුවන් id එකක් භාවිතා කරමින්.

- Html tag එකට පසු id ලෙස ලබා දී html tag එකට unique id එකක් ලබා දී හැක.

```html
<body>
   <section id="products"></section>
</body>
```

LIVEWORKSHEETS

- එලෙස unique id එකක් ලබා දී එම id එකට css මඟින් style ලබා දුන් විට එම styles ආදාල වන්නේ එම id ඇති elements එකට පමණි.

- Css වලදී # symbol එකත් සමග id එක ලබා දී styles කරනු ලැබේ.

```css
#products{
  padding: 0;
}
```

- Class එක භාවිතා කර අපට අවශ්‍ය element section එක සඳහා style කරන ආකාරය බලමු.

- Html tag එකට පසු class ලෙස ලබා දීමෙන් html tag එකක් සඳහා class එක ලබා දිය හැක.

```html
<body>
   <section id="products">
     <article class="product"></article>
     <article class="product"></article>
     <article class="product"></article>
    </section>
</body>
```

- Class එකකට style ලබා දිමේ දී නැවතිමේ තිතට පසු (".") අදාල class එකේ නම ලබා දී style ලබා දෙනු ලැබේ.

```css
.product{
  background-color: coral;
}
```

- Id එක හා class එක යොදා ගනිමින් style කරන විට බැලූ බැල්ම එකම ආකාරය බව පෙනේ. නමුත් මෙහි ඇති වෙනස වන්නේ id එක element එකක් සඳහා යොදා ගත හැක්කේ එක් අවස්ථාවක් පමණි. නමුත් එකම class එක element කිහිපයක් සඳහා වුවද යොදා ගැනිමට හැකියාව පවති.

LIVEWORKSHEETS

- Attribute යොදා ගෙන style කරන ආකාරය සලකා බලමු.

- මේ සඳහා අපි dp code website එක වෙත ගමන් කිරිම coding කරමු.

```
<body>
    <a href="https://dpcode.lk/" target="_blank">DP coding School</a>
</body>
```

> ඔබ ලබා දෙන link එකට අදාල website එක ඔබේ web browser එකහි අලුත් tab එකක open වීම සඳහා මෙම code එක භාවිතා කරයි.

- දැන් පහත ආකාරයට style කර ගන්න.

```
a[href="https://dpcode.lk/"]{
  color: orange;
}
```

- මේ ආකාරයට attribute භාවිතා කරමින් style සිදු කිරිමට හැකියාව පවති.

- නමුත් මෙහිදී එම attribute එකෙහි value එකේ වෙනසක් සිදු වුවහොත් එම වෙනස css මඟින් සිදු නොවේ.

- උදාහරණයක් ලෙස ඉහත dp coding school හි link එකේ වෙනසක් සිදු වුවහොත් ඉහත අප යෙදූ style එකෙහි ද වෙනසක් කල යුතුය.

- මෙයට හේතුව style වලදී මුළු link එකම යොදා ගැනීමයි. මෙයට විසඳුම ලෙස මුළු link එකම use නොකර “dpcode” යන වචනය පමණක් use කරමින් style සිදු කරමු.

```
a[href*="dpcode"]{
  color: orange;
}
```

- තවද characters එක start වෙන පලමු වචන භාවිතා කරමින් style කරන ආකාරය පහත පරිදි වේ.

```
a[href^="https"]{
  color: orange;
}
```

LIVEWORKSHEETS

❖ අවසාන වචන භාවිතා කරමින් style කරන ආකාරය පහත පරිදි වේ.

```
a[href$="lk/"]{
  color: orange;
}
```

❖ පලමු වචනය හා අවසන වචන යන දෙකම අල්ලා code කරන ආකාරය පහත පරිදි වේ.

```
a[href^="https"][href$="lk/"]{
  color: orange;
}
```

## <u>Relational Selectors</u>

❖ ඔබ දැන් දන්නවා basic selectors මඟින් elements තොරා ගන්න. දැන් අප බලමු relational selectors මඟින් elements තොරා ගන්නා ආකාරය.

❖ ඒ සඳහා index.html page එක පහත පරිදි සකස් කර ගනිමු. මෙහි paragraph element එකට style ලබා දිය යුතුය.

```
<body>
  <section id="products">
    <p>
      This is a basic HTML starter project you can build on however you like.
    </p>
  </section>
</body>
```

❖ Paragraph element එක සඳහා style ලබා දිය හැකි ආකාරවක් වන්නේ paragraph element එක සඳහා id එකක් හෝ class එකක් ලබා දී එමඟින් එම element එක සඳහා style ලබා දිමයි.

❖ නමුත් මෙහිදි වන්නේ paragraph element එක සඳහා id එකක් හෝ class එකක් ලබා නොදි style කල හැකි ආකාරයක් පවති.

```
body{
  margin: 10px;
}
#products p{
  color: orange;
}
```

**මේ ආකාරයට section එකෙහි id එකට පසුව p ලෙස ලබා දී paragraph element එක සඳහා style ලබා දිය හැකිය.**

LIVEWORKSHEETS

❖ එවිට result එක පහත පරිදී ලබා ගත හැකිය.




❖ Selection element එක තුලට තවත් paragraph element එක් කල විට ඉහත පරදී style එක appley වේ.




❖ දැන් අපට පළමු paragraph element එක පමණක් style කිරීම ට අවශ්‍ය යැයි සිතමු.

❖ මෙහිදී පළමු paragraph element එක product section element එකෙහි direct child වේ.

❖ එමනිසා පහත පරදී style සිදු කල හැකිය.




LIVEWORKSHEETS

❖ දැන් product section element එකට පසුව ඇති paragraph element එකක් සඳහා style කරන ආකාරය බලමු.

❖ Index.html page එක පහත ආකාරයට code කර ගන්න.

```
<body>
  <section id="products">
    <p>
      This is a basic HTML starter project you can build on however you like.
    </p>
    <article>
      <p>
        It defines the content and structure of web content.
      </p>
    </article>
  </section>
  <p>
    It is often assisted by technologies such as Cascading Style Sheets and scripting languages such as JavaScript.
  </p>
  <p>
    Web browsers receive HTML documents from a web server or from local storage and render the documents into multimedia web pages.
  </p>
</body>
```

❖ දැන් පහත පරිදි style කර ගනිමු.




**products id එකට පසු + (plus) ලකුණ සමඟ p ලබා දී ඇත. එවිට product section element එකට පසුව ඇති paragraph element එක සඳහා style එක apply වී ඇත. එම paragraph element එකට පසුව ඇති paragraph element සඳහා මෙම style apply නොවේ.**

❖ දැන් product section element එකට පසුව ඇති සියලු paragraph element එකක් සඳහා style කරන ආකාරය බලමු.




**products id එකට පසු ~ ලකුණ සමඟ p ලබා දී ඇත. එවිට product section element එකට පසුව ඇති සියලු ම paragraph elements සඳහා style එක apply වී ඇත.**

LIVEWORKSHEETS

❖ මෙහි ඇති ගැටලුවක් වන්නේ style ලබා දිමන් පසු html code එකෙහි වෙනසක් සිදු කරහොත් එම වෙනස style එකට බලපානු ඇත.

❖ ඉහත html code එකෙහි අවසාන paragraph element එක, product section element එකට උඩින් ගෙන ගිය විට ඉහත style එක එම paragraph element එක සඳහා apply නොවේ.




LIVEWORKSHEETS